මගේ අංකය:-WP/ED/FIN/08/02
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
නො.89 රන්මගපාය ,
කඩුවෙල පාර, බත්තරමුල්ල.
2022.11. 18

අතිරේක පළාත් අධ්‍යාපනඅධ්‍යක්ෂ (සැළසුම්/සංවර්ධන),
අතිරේක පළාත් අධ්‍යාපනඅධ්‍යක්ෂ (අධ්‍යාපන පරිපාලන),
අතිරේක පළාත් අධ්‍යාපනඅධ්‍යක්ෂ (පාලන),
ප්‍රධාන ගණකාධිකාරී ,
සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,

## ගිණුම් පියවීම 2022 මුදල් වර්ෂය

2022 මුදල් වර්ෂය වෙනුවෙන් බස්නාහිර පළාත් සභාව ඇතුළු සෑම රාජ්‍ය ආයතනයකම වියදම් දැරීම සඳහා දී ඇති වොරන්ට් බලපත්‍රයේ අධිකාරි බලය 2022 ජනවාරි 01 දිනෙන් ආරම්භ වී දෙසැම්බර් 31 දිනෙන් අවසාන වේ. 2022 මුදල් වර්ෂයට අදාලව සියළු ගෙවීම් එම අධිකාරී බලය ඉක්මවීමට පෙර ගෙවා නිම කර ප.මු.රි. 259 අනුව ඉතිරි මුදල් මෙම දෙපාර්තමේන්තුව විසින්ද දෙසැම්බර් 31ට පෙර පියවිය යුතුවේ. ඒ සඳහා කල්වේලා ඇතිව ඊට සූදානම් වීමට සහ වර්ෂ අවසානයේ ඇති වන තදබදය අවම කර ගැනීමට මෙම උපදෙස් යොමු කරමි. මෙහි සඳහන් කරුණු පිළිබඳ සියළු විදුහල්පතිවරුන්, ගුරුභවතුන්, ගුරු උපදේශකවරුන් ඇතුළු අනෙකුත් සියළුම කාර්ය මණ්ඩලය දැනුවත් කර 2022 දෙසැම්බර් 31 දින ගිණුම් පියවීම සඳහා අවශ්‍ය සහාය ලබා ගන්නා ලෙස දන්වමි. එසේම ඊට අමතරව පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන ලෙස දැනුවත් කරමි. වර්තමානයේ රටේ පවතින ආර්ථික මූල්‍ය අර්බුදය හමුවේ මෙම වර්ෂයේ වියදම් පාලනය කිරීමෙන් වරින් වර බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් විසින් නිකුත් කරන ලද බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක CSWP/FIN-AP/03/F1/04 හා CSWP/FIN-BD/02/F1/09-2021(B) හා 2022.04.27 හා 2022.07.06 දින යනාදී චක්‍රලේඛයන්හි විධිවිධාන කෙරෙහි නැවතත් අවධානය යොමු කරමින් කටයුතු කරන ලෙස අවධානය යොමු කරවමි.

### 02.විසර්ජන ලෙජරය.

වාර්ෂික මුදල් ප්‍රකාශය මඟින් අනුමත වූ ප්‍රතිපාදන වැඩි කොටසක් මෙම වර්ෂයේ මුල් භාගයේම ඔබ වෙත නිදහස් කර එවා ඇත. එම ප්‍රතිපාදන තුලින් යම් යම් හේතුන් නිසා ප්‍රතිපාදන අතිරික්තයක් නිරූපණයවේ නම් ප්‍රමාණවත් කාලයක් තුල එම ප්‍රතිපාදනයන් මෙම දෙපාර්තමේන්තුවේ මුදල් අංශය වෙත පවරා දීමට කටයුතු කල යුතුය. ප්‍රතිපාදන ඉක්මවා වියදම් කිරීමත් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළඹීමත් බලවත් වරදක් වන බැවින් එවැනි සීමාවන් නොඉක්මවන බවට සැහිමකට පත් විය යුතුය. දැනටමත් ඔබ කලාප අධ්‍යාපන කාර්යාලයන්හි වියදම් දැරිම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා දී ඇතත් එම ප්‍රතිපාදනයන් ප්‍රමාණවත් නොවන්නේ නම් ඒ සඳහා ගිණුම් වර්ෂය අවසාන වීමට ප්‍රථම ප්‍රමාණවත්, කාලයක් තිබියදී මෙම දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය දැනුවත් කල යුතුවේ.

### 03.විදුලිය,දුරකථන බිල්පත්,දුම්රිය බිල්පත් හා වෙනත් ගෙවීම්.

පවත්නා වූ මුදල් වර්ෂයේ කළ යුතු දැනට ලැබී ඇති බිල්පත් පරීක්ෂා කර වහාම නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කල යුතු අතර ලැබී නොමැති බිල්පත් ලබා ගෙන නිරවුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

### 04.<u>ශිෂ්‍යත්ව ආධාර මුදල්.</u>

ගුරු වැටුප් ගෙවීම වැනි ඉහළ ප්‍රමුඛත්වයක් මෙම ගෙවීම් කෙරෙහිද දැක්විය යුතු වේ. ඒ අනුව එකිනෙක ශිෂ්‍යත්වලාභීන් වෙත ගෙවිය යුතු හා වර්ෂය තුල ගෙවන ලද ශිෂ්‍යාධාර පිළිබඳව නැවත පරික්ෂා කර අදාළ ගෙවීම් කඩිනමින් කරන ලෙස දැනුවත් කරමි.

### 05.<u>ගෙවූ අග්‍රිම අත්තිකාරම් පියවා ගැනීම.(මු.රී.261).</u>

නිලධාරීන් විසින් දැනට ලබා ගෙන ඇති අත්තිකාරම් මුදල් මු.රෙ.,ප.මු.රී. හා අදාල චක්‍රලේඛ යනාදියෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. ඔබ විසින් කල්වේලා ඇතිව අග්‍රිම ගිණුමේ නිවැරදිතාවය තහවුරු කර ගත යුතුය.

### 06.<u>ගමන් වියදම් නිරවුල් කිරීම.(මු.රෙ.211 හා ආ.සං.14 වන පරි.28.5-7).</u>

ගමන් වියදම් ඉල්ලුම් කරන්නේ නම් දින 30 ඇතුලත ඉල්ලුම් කරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලෙස නැවතත් දන්වමි. 2022 නොවැම්බර් මස 30 වැනි දිනට දක්වා සිදු කර ඇති රාජකාරී ගමන් හා ස්ථාන මාරුවීම් වෙනුවෙන් අදාල ගමන් වියදම් ඉල්ලීම් නොපමාව ලබා ගෙන 2022 දෙසැම්බර් මස 16 වන දිනට පෙර ගෙවා නිම කරන ලෙස දන්වමි. 2022 දෙසැම්බර් මස තුලදී කරනු ලබන රාජකාරී ගමන් වලට අදාළ ගෙවීම් ද හැකි පමණ දෙසැම්බර් 31 දිනට පෙර ගෙවා නිම කල යුතුය.

### 07. <u>ඉන්ධන බිල්පත්</u>

2022 නොවැම්බර් මස 30 වැනි දින දක්වා සපයා ඇති ඉන්ධන වෙනුවෙන් ඇති බිල්පත් නොපමාව ගෙන්වා ගෙන ඒවා 2022 දෙසැම්බර් 10 දිනට පෙර ගෙවා නිම කිරීම හා 2022 දෙසැම්බර් මාසයේ සැපයීම් වෙනුවෙන් බිල්පත් ලබා ගැනිමට හැකි නම් එසේ ලබා ගෙන ඒවා ද දෙසැම්බර් මාසය තුල නිරවුල් කිරීම. ඉන්ධන අත්තිකාරම් ලබා දී තිබේ නම් එම අත්තිකාරම් දෙසැම්බර් බිලට හිලව් කිරීමට හෝ පියවා ගැනිමට ක්‍රියා කිරීම. නැතහොත් ඇනවුම් මඟින් ඉන්ධන ලබා ගන්නේ නම් වර්ෂය මුල තැන්පත් කර ඇති මුදල වර්ෂය අවසානයේ බිල්පත් මඟින් පියවා ගැනිමට කටයුතු කල යුතුය.

### 08. <u>විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම</u>

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සඳහා විශේෂ ව්‍යාපෘති අරමුදල් මූලාශ්‍ර යටතේ (උදා :- GEMP) 2022 වර්ෂය තුල ලබා දී ඇති ප්‍රතිපාදන හා අක්මුදල් අදාළ අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනීමෙහිලා ඵලදායිව යොදා ගෙන ඇත්දැයි පාසල් මට්ටමෙන්, කලාප මට්ටමෙන් හා දෙපාර්තමේන්තු මට්ටමෙන් අඛණ්ඩව පරික්ෂා කළ යුතු අතර එය පූර්ණ වශයෙන් උපයෝජනය වී ඇති බවට තහවුරු කර ගත යුතුවේ. එසේම එම ව්‍යාපෘති යටතේ ලබා දෙන ලද අග්‍රිම ඉක්මවා වියදම් කිරීමෙන් වලකින ලෙසද මෙයින් දැනුවත් කරමි.

### 09. <u>ප්‍රතිපූර්ණය කළ යුතු බිල්පත්</u>

පාසල් හී විදුලිය, ජලය, දුරකථන වැනි මාසික බිල්පත් ගෙන්වා ගනිමින් ඒ පිළිබඳව ලබා දී ඇති උපදෙස් වලට අනුකූලව කඩිනමින් ප්‍රතිපූර්ණයන් සිදු කර අවසන් කිරිම. 2022 වර්ෂය තුල එවැනි බිල්පත් ප්‍රතිපූර්ණයන් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සැලසී ඇති බැවින් ඒවා ඉදිරි වර්ෂයන් සඳහා ඉදිරිපත් විමේ හැකියාවන් නොමැති බවට තහවුරු කර ගත යුතුය. එසේම 2022 නොවැම්බර් දක්වා වූ බිල්පත් පාසල් වෙතින් ගෙන්වා ගෙන 2022 දෙසැම්බර් සහ පෙර ගෙවීම් කටයුතු අවසන් කළ යුතුය.

10. 2022 පුණරාවර්තන වියදම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

මෙම සැලැස්ම යටතේ ඔබ කලාප අධ්‍යාපන කාර්යාල ඒ ඒ යටතේ වන කොට්ඨාස අධ්‍යාපන කාර්යාල / පාසල්හී ගොඩනැගිලි නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තු ශීර්ෂය යටතේ අනුමත ප්‍රතිපාදනයන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු කාර්යාල හරහා ක්‍රියාත්මක වන අතර, එම නඩත්තු කටයුතු කඩිනමින් අවසන් කර ගැනීම සඳහා දැඩි අවධානයකින් ,අධීක්ෂණයකින් යුතුව කටයුතු කරන ලෙස දැනුවත් කරන අතර, එම කාර්යන් වර්ෂය අවසාන වීමට ප්‍රථම නිම කර ගැනීම සඳහා ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල , දෙපාර්තමේන්තු සැලසුම් අංශය, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සැලසුම් අංශ හා ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයන්හි ගිණුම් අංශ සමඟ මනා සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කරන ලෙස මෙයින් දන්වමි.

11.සියළුම සැපයීම් කටයුතු (මු.රී.146.4).

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධි විධානයන් හා බස්නාහිර පළාත් සභාව විසින් වරින් වර නිකුත් කර ඇති රීති හා උපදෙස් ප්‍රකාරව හා සැපයීම් කටයුතු පිළිබඳ වෙනත් නීතිමය විධිවිධානයන්ට යටත් ව සියළු කටයුතු 2022.12.31 දිනට අවසන් කර තිබිය යුතුයි. එමෙන්ම කවර හේතුවක් නිසා හෝ

- වර්ෂය අවසානයේ භාණ්ඩ නොලැබ් චෙක්පත් ලියා තබා ගැනීම.
- ගබඩා සහතිකය නොමැතිව ගෙවීම් සහතික කිරීම.
- ප්‍රතිපාදන මුදල් තැන්පත් ගිණුම්වලට මාරු කිරීම. කවර හෝ නිලධාරියෙකු නොකළ යුතු බව විශේෂයෙන් අවධාරණය කරමි. මේ සම්බන්ධව මු.රී.146.4 කෙරේද අවධානය යොමු කරමි.

12.Cigas මෘදුකාංග පද්ධතිය සඳහා වත්කම් පිළිබඳ තොරතුරු ඇතුලත් කිරීම.

මේ යටතේ ඔබ කලාප අධ්‍යාපන කාර්යාලය හා ඒ යටතේ වන සියළු ආයතනයන්හි (කොට්ඨාස අධ්‍යාපන කාර්යාල, සම්පත් මධ්‍යස්ථාන, පාසල් යනාදි) වන සියළු වත්කම් උක්ත සඳහන් Cigas මෘදුකාංග පද්ධතියට ඇතුලත් කිරීම 2022.11.30 දින වන විට අවසන් කළ යුතු බව බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් දැනුවත් කර ඇති අතර ඒ සඳහා ප්‍රමුඛ අවධානයක් යොමු කරමින් කටයුතු කරන ලෙස දැනුවත් කරමි.

13.පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා ඒ යටතේ ඇති සියළුම ආයතනයන් හි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම. (මු.රී.476).

පළාත් මුල්‍ය රීති 476 හා 2016.08.22 දිනැති මුල්‍ය චක්‍රලේඛ අංක 14/2016 ප්‍රකාරව සියළුම කාර්යාල විසින් තම කාර්යාලයේ බඩු බාහිරාදිය ගැන භාණ්ඩ සමීක්ෂණය 2022 වර්ෂය වෙනුවෙන් කල යුතු වේ. මේ සම්බන්ධයෙන් ඉදිරියේදී මෙම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන උපදෙස් පරිදි කටයුතු කර පාසල් හා අනෙකුත් ආයතනයන්හි භාණ්ඩ සමීක්ෂණ නියමිත දිනට පෙර අවසන් කර අදාල වාර්තාවන් විගණකාධිපති වෙත යොමු කිරීමට අවශ්‍ය විධිවිධාන සලසා ගන්නා ලෙස දන්වමි.

14.රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම.

පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම 2023 පෙබරවාරි මස ඒකාබද්ධ කර ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුව ඇත. නියමිත දිනට ගිණුම් ඉදිරිපත් කළ හැකිවනු පිණිස වැටුප් කට්වල මට්ටමින් සහ අවසාන වැටුප් සාරාංශය සමඟ පාලන ගිණුම් හර සහ බැර මාසිකව සැසඳීමට පියවර ගත යුතුය. මෙහිදී සොයා ගන්නා ලද වැරදි හර බැර දෙසැම්බර් 31 දිනට පෙර නිවැරදි කර ගිණුම් ගත කළ යුතු අතර සැසඳීම් ප්‍රකාශ වලට ඒවා ඇතුලත් නොකිරීමට වග බලා ගතයුතු වේ. එමෙන්ම පසුගිය

# 2022 මුදල් වර්ෂය සඳහා ගිණුම් පියවීමට අදාළ විවිධ කාර්යයන් සඳහා නිශ්චිත අවසාන දිනයන්

| අනු අංක | කාර්යය | කාර්යය සම්බන්ධ පැහැදිලි කිරීම | කාර්යය නිම කළ යුතු නිශ්චිත අවසාන දිනයන් |
|---|---|---|---|
| 01. | මුදල් පොත පියවීම | කාර්යාලයේ මුදල් පොත 2022.12.31 දින 24.00 පැයට හෝ ඊට පෙර එම කාර්යය සඳහා පත්කරනු ලැබූ මාණ්ඩලික නිලධාරියකු විසින් නැවත කිසිදු වවුචරයක් ඇතුලත් කල නොහැකි වන ලෙස ඉරි ගැසීමෙන් මුදල් පොත වසා අත්සන් කර වේලාව ද සටහන් කල යුතුය. | 2022.දෙසැම්බර් 31 දින |
| 02. | ගිණුම් සාරාංශය ඉදිරිපත් කිරීම | 2022 දෙසැම්බර් මාසයට අදාල ගනුදෙනු ඇතුලත් ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීම. | 2022 ජනවාරි මස වැඩකරන පළමු දින 03 තුළ |
| 03 | පරිපූරක ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීම | ගිණුම් ප්‍රකාශ අනුව ගන්නා ලද වැරදි නිවැරදි කිරීම් ඇතුළත් පරිපූරක ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීම.(පළාත් භාණ්ඩාගාරය විසින් භාර ගනු ලබනුයේ එක් පරිපූරක ගිණුම් සාරාංශයක් පමණක් බවද සැලකිය යුතුවේ.) | 2022 ජනවාරි 16 දින හෝ ඊට පෙර |
| 04. | බැරකම් හා බැඳීම් පිළිබඳ විස්තරය ඉදිරිපත් කිරීම | පවත්නා මුදල් වර්ෂයේ කල යුතු ගෙවීම් අවසන් කල වහාම 2022.12.31 දිනට හිඟව පවත්න බැරකම්/බැඳීම් පිළිබඳ විස්තර ඇතුලත් ප්‍රකාශයක් පිළියෙල කිරීම<br>I. ගෙවීම් ලබන්නාගේ නම<br>II. වැඩ සේවාවන් සැපයීම පිළිබඳ විස්තර<br>III. ගෙවිය යුතු නියම මුදල හෝ දළ මුදල<br>IV. පවත්නා වර්ෂයේ වැය විස්තරය | 2022 ජනවාරි 12 දින හෝ ඊට පෙර |
| 05. | අත්තිකාරම් බී ගිණුම | ඒකාබද්ධ ගිණුම සකස් කළ හැකි පරිදි අමාත්‍යාංශ/පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව / කලාප අධ්‍යාපන කාර්යාලය අත්තිකාරම් බී ගිණුම සකස් කිරීමේ කටයුතු 2022 වර්ෂය අවසන් වීමට පෙර ආරම්භ කළ යුතුවේ. | 2022 පෙබරවාරි 03 දින හෝ ඊට පෙර |